# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,420 - 2025 ජනවාරි මස 17 වැනි සිකුරාදා - 2025.01.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... | 92 |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| පළාත් පාලනන සහා ඡන්ද ආඥාපනත යටෙත් දැන්වීම්... ... | — |
| ආදායම් හා වියදම් පිළිබ්‍රඳ ප්‍රකාශන ... ... | — |
| අයවැය ලේඛන ... ... | — |
| දේපළ විකිණීම් ... ... | 108 |
| විවිධ දැන්වීම් | |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

ගැසට් පත්‍රයේ පළකරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 පෙබරවාරි 07 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

91 - B 082647 — 5,403 (2025/01)
F 1 -

**කැළණිය ප්‍රාදේශීය සභාව**

කැළණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 262 ඒ මැවැල්ල ග්‍රාම නිලධාරි වසමට අයත් අතුරු මාර්ග සභාවට පවරා ගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) වගන්තිය යටතේ බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි 2024.09.27 වැනි දින අංක 2404 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* IV(ආ) කොටසේ පළ කරනලද දැන්වීම පරිදි දින 14 ක් ඇතුළත එහි සඳහන් පාරවල් කැළණිය ප්‍රාදේශීය සභාවට පවරා ගැනීම පිළිබඳව විරෝධතාවන් ඉදිරිපත් කිරීමක් හෝ නඩු පැවරීමක් සිදු වී නැති නිසා එකී සියළු පාරවල් එහි පළ කර ඇති ආකාරයට සභාවේ පාරවල් ලෙස පොදු ජනතාවගේ දැන ගැනීම සඳහා එකී ප්‍රාදේශීය සභා පනතේ 24(3) වැනි උපවගන්තිය ප්‍රකාර මෙයින් ප්‍රසිද්ධ කරමි.

ඊ. එල්. සුභසිංහ,
ලේකම් හා සභාවේ බලතල හා කාර්යය කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
කැළණිය ප්‍රාදේශීය සභාව.

2024 දෙසැම්බර් මස 31 වැනි දින,
කැළණිය ප්‍රාදේශීය සභාව,
බුළුගහ හන්දිය, කැළණිය.

01-568

---

**මතුගම ප්‍රාදේශීය සභාව**

මාර්ග එක් දිශාවකට පමණක් ධාවනය වන මාර්ග බවට නීත්‍යානුකූල කිරීම

1984 අංක 40 දරන මෝටර් වාහන පනතේ 164 (ආ) i වගන්තිය අනුව මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පහත උපලේඛනයේ විස්තර කර ඇති මාර්ග එක් දිශාවකට පමණක් ධාවනය වන මාර්ග බවට පත් කර ඇති බව මෙයින් දැනුම් දෙමි.

නෙලූ නිශාන්ති ඉද්දගොඩ,
ප්‍රාදේශීය සභාවේ ලේකම් හා මතුගම ප්‍රාදේශීය සභාවේ බලතල,
කාර්යය කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
මතුගම ප්‍රාදේශීය සභාව.

2024 දෙසැම්බර් මස 30 වැනි දින,
මතුගම ප්‍රාදේශීය සභාවේ දී ය.

**උපලේඛනය**

1. පළාත් පාලන ආයතනයේ නම - මතුගම ප්‍රාදේශීය සභාව
2. දිස්ත්‍රික්කය - කළුතර
3. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය - මතුගම

| *මාර්ගය* | *ආරම්භය* | *අවසානය* | *දිශාව* | *කාලය* |
|---|---|---|---|---|
| ශාන්ත මරියා මාවත | අගලවත්ත පාර | අලුත්ගම පාර | අගලවත්ත පාර සිට අළුත්ගම පාර දක්වා | |
| ආනන්ද මාවත | නැබඩ පාර | අගලවත්ත පාර | නැබඩ පාර සිට අගලවත්ත පාර දක්වා | පාසල් දිනයන් තුළ |
| | | | | පෙ.ව. 6.30 - පෙ. ව. 8.00 |
| | | | | ප.ව. 12.00 - ප. ව. 2.00 |
| ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මාවත | සංස්කෘතික මධ්‍යස්ථානය අසලින් | අලුත්ගම පාර | සංස්කෘතික මධ්‍යස්ථානයේ සිට අලුත්ගම පාර දක්වා | පාසල් දිනයන් තුළ |
| | | | | පෙ.ව. 6.30 පෙ. ව. 8.00 |
| | | | | ප.ව. 12.00 - ප. ව. 2.00 |

01-190